# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුරගමන් මගී දුම්රිය කට්ටලවල මැදිරි සහ වැසිකිළි අභ්‍යන්තර පිරිසිදු කිරීම සහ සනීපාරක්ෂක සේවා සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය - SRS/F. 8171

01. කොළඹ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුරගමන් මගී දුම්රිය කට්ටලවල මැදිරි සහ වැසිකිළි අභ්‍යන්තරය පිරිසිදු කිරීම සහ සනීපාරක්ෂක සේවා සැපයීම (SRS/F. 8171) සඳහා දේශීය සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු භාරගනු ලැබේ.

02. ලංසු තැබීම ජාතික තරගකාරී ලංසු තැබීමේ (NCB) ක්‍රියාපටිපාටිය යටතේ සිදු කෙරේ.

03. උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ලබාගැනීම සහ ලංසු ලේඛන පරීක්ෂා කිරීම පහත ලිපිනයෙන් 2026.04.10 සිට 2026.05.07 දක්වා වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සිදු කළ හැකිය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **94(11) 2438078 හෝ 94(11) 4600204** |
| **ෆැක්ස් අංක** | : | **94(11) 2432044** |
| **විද්‍යුත් තැපෑල** | : | **pot1@railway.gov.lk, srs.slr@gmail.com, tender2@railway.gov.lk** |
| **වෙබ් අඩවිය** | : | **www.railway.gov.lk** |

04. මහා පරිමාණ පොදු ප්‍රවාහන වාහන ඇතියක්, සනීපාරක්ෂක පහසුකම් සහ වායුසමනය කළ මැදිරි හෝ මහා පරිමාණ පොදු උපයෝගීතා සේවාවල පිරිසිදුකම පවත්වාගෙන යාමේ හැකියාව සහ පළපුරුද්ද තහවුරු කිරීමට ලංසුකරු විසින් ලේඛන ගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

05. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසූ සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කොට් මාවත, කොළඹ 10 වෙත ඉදිරිපත් කරන ලිඛිත අයදුම්පතක් මගින් 2026.04.10 සිට 2026.05.07 ප.ව. 3.00 දක්වා රු. 35,000.00 ක ආපසු නොගෙවන ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් පසු ලබාගත හැකිය.

06. සියලුම ලංසු සමග ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකර මුදල රු. 2,000,000/- විය යුතු අතර, එය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද බැංකුවකින් නිකුත් කරන ලද කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.

07. පූර්ව ලංසු රැස්වීම 2026.04.28 දින පෙ.ව. 10.00 ට ශ්‍රී ලංකා දුම්රිය සේවය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, ඕල්කොට් මාවත, කොළඹ 10 යන ස්ථානයේදී පැවැත්වේ.

08. ලංසු 2026.05.08 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතු අතර, ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවේදී ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ඒ සඳහා සහභාගි විය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති, දෙපාර්තමේන්තු කමිටුව,**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කොට් මාවත, කොළඹ 10.**

**යොමු අංකය : SRS/F. 8171**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.**